www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවඃ රාජ්‍ය අංශයේ ‘ස්වාධීන’ වෘත්තීය සමිති රාජපක්ෂ ඉදිරියේ දනින් වැටේ

## Sri Lanka: "Independent" public sector unions kowtow to Rajapakse

**ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි**
**2009 නොවැම්බර් 14**

දේශපාලන පක්ෂවලින් "ස්වාධීන" යයි කියාපාන රාජ්‍ය අංශයේ වැටුප් සමාලෝචන වෘත්තීය සමිති කමිටුව (පීඑස්එස්ආර්ටීයූසී) වැටුප් උද්ඝෝෂනයක් පිලිබඳව සාකච්ඡා කිරීමට නොවැම්බර් 5 වන දා නියෝජිත සමුලුවක් පැවැත්වීය.

මෙම සමුලුව පැවැත්වුනේ වැටුප් හා සේවා කොන්දේසිවල බාදනයට එරෙහිව රාජ්‍ය අංශයේ කම්කරුවන් අතර පුලුල්ව පැතිරුනු අතෘප්තිය මධ්‍යයේ ය. පසුගිය තෙවසර පුරා ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් කම්කරුවන්ගේ වැටුප් කැටිකර තැබීම සඳහා බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ)යට එරෙහිව ගෙනගිය වාර්ගික යුද්ධය යොදා ගනු ලැබුවේ බඩු මිල බෙහෙවින් ඉහල ගිය තතු යටතේ ය. මැයි මාසයේ දී එල්ටීටීඊය පරාජය කිරීමෙන් අනතුරුව ද ජාතිය ගොඩනැගීමේ නාමයෙන් රාජ්‍ය අංශයේ කවර හෝ වැටුප් වැඩිකිරීමකට ආන්ඩුව විරුද්ධ විය.

පසුගිය සතියේ වෘත්තීය සමිති සමුලුව කැඳවනු ලැබුවේ සාධාරන වැටුපක් සහ යහපත් රැකියා කොන්දේසි සඳහා රාජපක්ෂ තන්ත්‍රයට එරෙහිව දේශපාලන සටනක් සංවිධානය කිරීම සඳහා නොව කම්කරුවන්ගේ වැඩෙන විරුද්ධත්වය රඳවා තැබීමට සහ මර්දනය කිරීමටයි. යුද්ධය පවතින කාලය තුල මිලිටරි ප්‍රයත්නයන්ට සහයෝගී වන අයුරින් වැටුප් ඉල්ලීම් පසෙක තබනු යයි ආන්ඩුවෙන් කෙරුනු අවධාරනයට මෙම වෘත්තීය සමිති හිස නැමූහ. දැන් යුද්ධය නිමා වීමෙන් පසු රාජපක්ෂ සමග ඔවුන්ගේ සහයෝගීතාව දිගටම පවත්වාගෙන යති.

සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති සංධානය (එච්එස්ටීයූඒ), තැපැල් සහ විදුලි සංදේශ නිලධාරීන්ගේ සංගමය, ලංකා ගුරු සංගමය, රජයේ මුද්‍රන කම්කරුවන්ගේ සංගමය, දුම්රිය වෘත්තීය සමිති ඒකාබද්ධ පෙරමුන සහ එක්සත් කම්කරු සම්මේලනය ඇතුලු වෘත්තීය සමිති සහ පෙරමුනු 17කින් පීඑස්එස්ආර්ටීයූසීය සමන්විත වේ.

මෙම සමුලුවේ දී නිශ්චිත වැටුප් ඉල්ලීමක් මතු නො කෙරුනි. නමුදු ලැබීමට නියමිත එහෙත් නො ගෙවන ලද රුපියල් 3,158ක මාසික ජීවන වියදම් දීමනාවක් ලබා දෙන ලෙස වෘත්තීය සමිති ආන්ඩුවෙන් ඉල්ලති. ඒ සමග ම විවිධ රැකියා ක්ෂේත්‍රයන්හි සහ ශ්‍රේනි අතර දිගු කාලීනව පවත්නා ප්‍රධාන වැටුප් විෂමතා ඉවත් කරන ලෙස ද ඔවුහු ඉල්ලා සිටිති.

මෙම සියල්ල ලැබුන ද සැබෑ වැටුප් බාදනය පියවීම සඳහා මෙම ඉල්ලීම් කිසිසේත් නො සෑහේ. රාජපක්ෂ 2005 දී ජනාධිපතිවරනයෙන් ජයගෙන වැඩ බාරගත් සැනින් රාජ්‍ය සේවයේ කම්කරුවන් සඳහා ගෙවීමට බොහෝ කල් පමාවූ රුපියල් 2,500ක මාසික දීමනාවක් ලබා දුනි. 2007 දී ඔහු රුපියල් 375ක මාසික ජීවන වියදම් දීමනාවක් නිවේදනය කල නමුදු මුදල් නොමැති බව පවසමින් එම දීමනාව නතර කොට වැටුප් කැටි කිරීමක් ද ක්‍රියාත්මක කලේ ය. 2005 නොවැම්බර් සිට 2008 දෙසැම්බර් දක්වා වූ කාලය තුල නිල උද්ධමන අනුපාතය සියයට 3.6 සිට සියයට 26.2 දක්වා ඉහල නැගුනි.

පීඑස්එස්ආර්ටීයූසීයේ කැඳවුම්කරු සමන් රත්නප්‍රිය පසුගිය සතියේ ප්‍රකාශ කලේ සහන උදුරා ගැනීම සඳහා ආන්ඩුවට "විශාල පීඩනයක්" යෙදීමට විරෝධතා උද්ඝෝෂනයක් සංවිධානය කිරීම අරමුනු කොට සම්මේලනය කැඳවන බවයි. කොලඹ කොටුව දුම්රිය පොල ඉදිරිපිට නොවැම්බර් 18 වන දා පවත්වන තවත් "දැවැන්ත විරෝධතාවක්" මෙම සමුලුවේ දී ඔහු නිවේදනය කලේ ය. මේ වනවිට ත් ජනාධිපති රාජපක්ෂ මෙම වසර තුල කවර හෝ වැටුප් වැඩි කිරීමක් සිදු නො කරන බවට ප්‍රකාශ කොට ඇති අතර ලබන වසරේ මුල මැතිවරන පැවැත්වීමට නියමිතව තිබිය දී පවා ඔහු විසින් දී ඇත්තේ 2010 දී වැටුප් වැඩි කරන්නේ යයි කියනු ලබන බොරු පොරොන්දුවකි.

පීඑස්එස්ආර්ටීයූසී නායකයෝ පුරුද්දක් ලෙස ඔවුන් දේශපාලන පක්ෂවලින් "ස්වාධීන" යයි කියන අතර වෘත්තීය සමිති තුල "දේශපාලනය එපා" යයි අවධාරනය කරමින් කවර හෝ විවේචකයකු නිහඬ කරති. ප්‍රධාන දේශපාලන පක්ෂ කෙරෙහි කලකිරීමෙන් හා ඒවාට අනුබද්ධිත වෘත්තීය සමිතිවල නිරන්තර පාවාදීම් හේතුවෙන් කම්කරු ස්ථරයක් මෑත වසරවල දී මෙම "ස්වාධීන" වෘත්තීය සමිති දෙසට හැරී ගත්හ.

කෙසේ නමුත් පීඑස්එස්ආර්ටීයූසීයට නිශ්චිත දේශපාලනයක් ඇත. ඒ බැව් නියෝජිත සමුලුවට යන්තම් දින දහයකට පෙර ඔක්තෝබර් 26 දා මනාව ප්‍රදර්ශනය විය. "රටේ සංවර්ධනයට අදාල වන යෝජනා ඉදිරිපත් කිරීමට" ජනාධිපති රාජපක්ෂ හමුවීම සඳහා තම නිල නිවසට පැමිනෙන ලෙස කල ඇරයුම සමන් රත්නප්‍රිය සහ දුම්රිය වෘත්තීය සමිති ඒකාබද්ධ පෙරමුනේ (ජේඑෆ්ආර්ටීයූ) ලේකම් සම්පත් රාජිත බාර ගත්හ.

මෙම ජනාධිපති හමුවේ අරමුන උද්ධෘතයෙන් ම හැඟවේ. යුද්ධය නිමාවීමෙන් ඉක්බිති රාජපක්ෂ "ආර්ථික යුද්ධයක්" නිවේදනය කරමින් ජාතිය ගොඩනැගීම සඳහා කැපකරන ලෙස කම්කරුවන්ගෙන් ඉල්ලා සිටියේ ය. දැවැන්ත මිලිටරි වියදම් හා බැඳීගත් ගෝලීය අවපාතයෙන් ද මිරිකී සිටින ආන්ඩුව ගැඹුරු වන ආර්ථික අර්බුදයකට මුහුන දී සිටී. ගෙවුම් ශේෂ හිඟ අර්බුදයෙන් ගොඩ ඒම සඳහා පසුගිය ජූලියේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් බිලියන 2.6ක නයක් ගැනීමට ආන්ඩුවට බල කෙරින. මෙම නය අනුමත කරනු ලැබුවේ මහජන වියදම් කපාහැරීම් ඇතුලු කප්පාදු පියවර මාලාවක් ක්‍රියාත්මක කිරීමේ කොන්දේසි මතයි.

රාජපක්ෂ මෙම හමුව කැඳවනු ලැබුවේ කම්කරුවන්ගේ ඉල්ලීම්, විශේෂයෙන් ම වැටුප් වැඩිකිරීමේ ඉල්ලීම් මර්දනය කිරීම සඳහා වෘත්තීය සමිතිවල සහයෝගය තහවුරු කර ගැනීම සඳහා යි. හමුවට පැමිනි බොහෝ වෘත්තීය සමිති පාලක සංධානයේ ඒ හෝ මේ පක්ෂයකට බැඳීගත් ඒවා විය. "ස්වාධීන" වෘත්තීය සමිති සහභාගි වූ නමුදු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (සීපීසී), ලංකා විදුලිබල මන්ඩලය (සීඊබී) සහ වරාය අධිකාරිය තුල ක්‍රියාත්මක වන විපක්ෂයේ ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) සහ එක්සත් ජාතික පක්ෂයට (එජාප) සම්බන්ධිත වෘත්තීය සමිතිවලට ඇරයුම් නො කෙරින.

හේතුව ඉක්මනින් ම පැහැදිලි විය. විදුලිබල මන්ඩලයේ, තෙල් සංස්ථාවේ සහ වරායේ කම්කරුවන් ගෙනගිය අකුරට වැඩකිරීමේ උද්ඝෝෂනය රට අස්ථාවර කිරීමේ "ජාත්‍යන්තර කුමන්ත්‍රනයක" කොටසක් ලෙස විස්තර කරමින් එම වෘත්තීය සමිතිවලට දුෂ්ට ප්‍රහාරයක් දියත් කිරීම සඳහා රාජපක්ෂ මෙම හමුව යොදා ගත්තේ ය. ජවිපෙ සහ එජාප කුමන්ත්‍රනයේ කොටස්කරුවන් බවත් අකුරට වැඩකිරීමට සම්බන්ධිත වෘත්තීය සමිති සමග ගනුදෙනු බේරා ගතයුතු බවත් ඔහු පැවසීය. මෙහි නියම ඇඟවුමනම් වැටුප් හෝ සේවා කොන්දේසි සඳහා කම්කරුවන් කරන කවර හෝ උද්ඝෝෂනයක් මෙම "කුමන්ත්‍රනයේ" කොටසක් වන බවයි.

රාජපක්ෂගේ මෙම තර්ජනය එල්ල වූයේ එජාපයට හෝ ජවිපෙට සම්බන්ධ වෘත්තීය සමිතිවලට නොව කම්කරු පන්තියටයි. එජාප සහ ජවිපෙ රාජපක්ෂගේ යුද්ධයට උදවු කල අතර කම්කරු ඉල්ලීම් මර්දනය කිරීමට සහාය වූහ. ඔවුන්ගේ වැටුප් උද්ඝෝෂනය ආරම්භයේ සිටම ඉතා සීමිත වූ අතර රාජපක්ෂගේ හමුවට සහභාගි වීමේ අරමුනින් ඔක්තෝබර් 26ට පෙරාතුව එය නතර කෙරුනි.

මෙම හමුවට සහභාගි වීමෙන් ඊනියා ස්වාධීන වෘත්තීය සමිති රාජපක්ෂට තම සහයෝගයේ හස්තය දිගු කල අතර ඔහුගේ තර්ජනය සාධාරනීකරනය කිරීමට උදවු විය. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය (ලෝසවෙඅ)*ට අදහස් දක්වමින් සම්පත් රාජිත කියා සිටියේ මෙම උද්ඝෝෂනය "කුමන්ත්‍රනයක්" නො වන බව ඔහු ප්‍රකාශ කල බවයි. ඔහු පැහැදිලි කලේ මෙය ආන්ඩුවට විරුද්ධ "දේශපාලන අරගලයක" වෘත්තීය සමිති යෙදී නො සිටි බවට රාජපක්ෂව ඒත්තු ගැන්වීම සඳහා හමුවේ දී ඔහු උත්සාහ කල බවයි.

"අපි ජනාධිපතිතුමාට කිවුවා වැඩබිම්වල දැනටමත් නොසන්සුන් තත්වයක් මතු වී තිබෙන තතු යටතේ කම්කරුවන්ට කවර හෝ සහනයක් දීමට ආන්ඩුව අසමත් වුවහොත් එය විශාල ප්‍රශ්නයක් වෙයි කියලා. ජනාධිපතිතුමා කිවුවා රාජ්‍ය අංශයේ කම්කරුවන්ට 2010 ජනවාරියේ ඉඳලා වැටුප් වැඩිවීමක් ලැබෙනවා කියල. ඒත් ඒ වැඩිවීම කොච්චර ද කියල කිවුවේ නැහැ," රාජිත පැවසීය.

මෙම අදහස්වලින් බොහෝ දේ අනාවරනය වේ. රාජපක්ෂගේ ආන්ඩුවට, එහි ආර්ථික පිලිවෙත්වලට හෝ ප්‍රජාතන්ත්‍ර-විරෝධී විධික්‍රමයන්ට එරෙහිව දේශපාලන උද්ඝෝෂනයක් දියත් නො කරන බවට රාජපක්ෂට දෙන සහතිකයෙන් පීඑස්එස්ආර්ටීයූසීයේ "ස්වාධීනත්වය" සමන්විත වේ. ඒ වෙනුවට සුලු හෝ සහන කිහිපයක් ලබා නො දුන හොත් වෘත්තීය සමිතිවලට කම්කරුවන් රඳවා තබා ගැනීමට නො හැකි වී කම්කරුවන් අතරින් කැරැල්ලක් මතුවීමේ අනතුර ආන්ඩුවට ඇති බව පවසමින් රාජිත ජනාධිපතිට උපදෙස් දෙයි.

ඒ සමග ම රත්නප්‍රිය හා රාජිත "රට සංවර්ධනය කිරීමට" තම සහයෝගී යෝජනා කීකරු ලෙස ඉදිරිපත් කල ආන්ඩුවට හිතවත් වෘත්තීය සමිති නිලධරය සමග විවෘතව ඒකාබද්ධ වූහ. දුම්රිය කාර්යාලයන් පුද්ගලික ගොඩනැගිලිවලින් රජයේ ගොඩනැගිලිවලට ගෙනයන ලෙස ද දුම්රිය දෙපාර්තමේන්තුවට හිමි ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී සිටින්නන් ඉවත් කරන ලෙස ද රාජිත යෝජනා කලේ ය. ජනාධිපති හමුවීමෙන් අනතුරුව රාජපක්ෂගේ තර්ජනය හෙලා දැක හෝ ප්‍රහාරයට ලක් වී සිටින වෘත්තීය සමිති ආරක්ෂා කිරීම සඳහා හෝ පීඑස්එස්ආර්ටීයූසීය කිසිදු ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් නො කලේ ය.

පසුගිය සතියේ පැවති නියෝජිත සමුලුවේ දී රාජපක්ෂගේ සැඳහුම් විහිලු ලෙස හුවා දැක්වීමට රත්නප්‍රිය උත්සාහ කලේ ය. "කම්කරුවො වැටුප් ඉල්ලුවම ආන්ඩුව කියනව ඔවුන්ගෙ අරගල 'විදේශ කුමන්ත්‍රන' කියල. ආන්ඩුව එහෙම කියනවනම් අපි ඒක භාරගන්න පැකිලෙන්නෙ නැහැ. අපි ආන්ඩුවට

කියනව මේ ජාතියේ තකතීරු කතා නවත්තන්න කියල," යනුවෙන් රත්නප්‍රිය ගුගුලේ ය.

එහෙත් රාජපක්ෂගේ තර්ජනය විහිලුවක් නො වේ. යුද්ධය ගෙන යද්දී රාජපක්ෂ වැඩවර්ජිත කම්කරුවන් ජාතික ආරක්ෂාව අනතුරේ හෙලන බවට නිරතුරුව හෙලා දුටු අතර කිහිපවරක් වර්ජන බිඳ විසුරුවීම සඳහා මිලිටරිය බලමුලුගැන්වීය. මැයි මාසයේ සිට ආන්ඩුව ආරක්ෂක හමුදාවන් වර්ධනය කරන අතර වැඩවර්ජන නීති-විරෝධී බවට ප්‍රකාශ කිරීමට හා බලහත්කාරී අත්අඩංගුවට ගැනීම් නියෝග කිරීමට ජනාධිපතිට බලය ලබාදෙනුවස් රුදුරු හදිසි නීතිය දිගටම පවත්වාගෙන යයි.

මීට පෙර 2006 මාර්තු මාසයේ ගෙනගිය වැටුප් උද්ඝෝෂනය කඩාකප්පල් කිරීම සඳහා පීඑස්එස්ආර්ටීයූසීය ඉටුකල භූමිකාවෙන් කම්කරුවන් පාඩම් උකහා ගත යුතු ය. එක් දින වැඩවර්ජනයක් සඳහා 300,000කට අධික රාජ්‍ය සේවකයන් සහභාගි වූයේ ඉන් බොහෝ දෙනෙක් පීඑස්එස්ආර්ටීයූසීයේ වෘත්තීය සමිතිවල සාමාජිකයින් නො වන තතු යටතේ ය. අරගලය දිගටම ගෙන යනවා වෙනුවට සහ රාජපක්ෂගේ යුද සූදානම්වලට විරුද්ධ වනවා වෙනුවට පීඑස්එස්ආර්ටීයූසී නායකයෝ අරගලය සීමා කිරීමට හැකි සෑම දෙයක් ම කල අතර අවසානයේ දී එය නවතා දැමූහ.

මෙම නියෝජිත සමුලුවේ දී කම්කරුවන්ට චෝදනා කරමින් වෘත්තීය සමිතිවල ද්‍රෝහීත්වය සාධාරනීකරනය කිරීමට රත්නප්‍රිය උත්සාහ කලේ ය. "ආන්ඩුව අපිට කිවුවා යුද්ධය වෙනුවෙන් පටි තද කරගන්න කියල. අපේ පටි තද කරගන්න ඒ වෙලාවෙ අපි සූදානම් නො වුනත් කම්කරු පන්තිය සහ සාමාන්‍ය මහජනතාව රැල්ලට අහුවුනා (යුද්දෙට දෙන ලද සහය). අපි උත්සාහ කලත් කම්කරු පන්තිය නැගිට්ටවන්න අපි උත්සාහ කලත් අපට ඒක කරන්න නො හැකි වුනා."

මෙය පචයකි. වෘත්තීය සමිති තුල "දේශපාලනය එපා" යනුවෙන් හඬතලන්නන් රාජපක්ෂට සහ ඔහුගේ යුද්ධයට එරෙහිව කවර හෝ දේශපාලන උද්ඝෝෂනයක් ගෙන ගියේ නැත. එමෙන් ම ඔවුන් රාජපක්ෂට පුද්ගලිකව පොරොන්දු වූ අයුරින් ඔහුගේ පිලිවෙත්, බොරු හා තර්ජනවලට එරෙහිව දැන් අරගලයක් දියත් කරන්නේ ද නැත. මෙම "ස්වාධීන" වෘත්තීය සමිති නායකයෝ කම්කරු පන්තියේ සෑම අරගලයක් ම මර්දනය කිරීමට උදවු වීම මගින් වෛෂයිකව ආන්ඩුව සමග පෙලගැසෙති.

දේශපාලන ක්‍රියාමාර්ගයකින් තොරව කම්කරුවන්ට තම මූලික අයිතීන් සහ ජීවන කොන්දේසි රැක ගත නො හැක. වැටුප් සඳහා කෙරෙන කවර හෝ අරගලයක් කම්කරු පන්තිය අනිවාර්යයෙන් ම ආන්ඩුව සහ ආන්ඩුවට හිතැති, ජවිපෙට හිතැති, එජාප හිතැති හෝ ඊනියා "ස්වාධීන" යන සියලුම වෘත්තීය සමිති සමග දේශපාලන ගැටුමකට තල්ලු කරනු ඇත. එකම විකල්පය වන්නේ සමාජවාදී සමානතා පක්ෂය යෝජනා කරන ක්‍රියාමාර්ගය යි. එනම්, සමාජවාදී පිලිවෙත් මත පදනම් වුනු කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් බලයට ගෙනඒම සඳහා පාලක ප්‍රභූවේ සියලුම කොටස්වලින් ස්වාධීනව සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන් ද පීඩිත ජනකොටස් ද ඒකාබද්ධ කෙරෙන අරගලයක් දියත් කිරීම යි.

© www.wsws.org